රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 28/97

මගේ අංකය : IV/2/9/156/6/38(H)II-I
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1998 ජනවාරි මස 27 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල හා
රජයට අයත් සමාගම්වල සභාපතිවරුන්/නිසි බලධාරීන් වෙත.

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරීම.

සිංහල හා දෙමළ භාෂා දිවයිනේ රාජ්‍ය භාෂා විය යුතු යයි ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ 18 වන වගන්තිය මගින් ප්‍රකාශයට පත් කොට ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(4) වන වගන්තියට අනුව, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා සම්බන්ධ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නීති පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කෙරේ.

02. ඕනෑම තැනැත්තෙකුට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන කවර හෝ භාෂාවකින් රජය සමඟ කටයුතු කිරීමටත්, ඒ සඳහා තමන් කැමති භාෂාවකින් ලිපි ලිවීමට හා පිළිතුරු හා වෙනත් ලියකියවිලි ලබා ගැනීමටත් ඔහුට අයිතියක් ඇති බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ.

03. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා,

(අ) පිරිස් පුහුණුව, පරිවර්තන සේවා සැපයීම, පාරිභාෂික ශබ්දමාලා සම්පාදනය හා අමතර භාෂා නිපුණත්වය ලබා දීම ආදී කටයුතුවලින් රාජ්‍ය සේවයට සහාය වීම ද,

(ආ) භාෂා නීතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමද,

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර,

04. (අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම ද,
(ආ) භාෂා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව විමසිලිමත් වීම හා අධීක්ෂණය කිරීම ද,
(ඇ) භාෂා නීතිය ක්‍රියාත්මක නොවීම පිළිබඳව වූ පැමිණිලි විමර්ශනය හා ප්‍රතිකර්ම යෙදීම ද

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ඇත.

05. කෙසේ වුවද, නොයෙක් හේතු කරණකොට ගෙන, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යම් යම් බාධා ඇති වී ඇත. මින් ප්‍රධාන බාධාව වනුයේ සුදුසුකම් ඇති මිනිස් සම්පත් නොමැතිවීම සහ ආයතනික කටයුතු සම්පාදනයක් නොමැතිවීමත්ය. රාජ්‍ය සේවය තුළ, භාෂා දෙකකින් වැඩ කළ හැකි නිලධාරී සංඛ්‍යාව වැඩි කිරීමේ අපේක්ෂාවෙන්, දියත් කරන ලද ඇතැම් වැඩ සටහන් දැනටමත් ක්‍රියාත්මක වේ. මේ පිළිබඳව නීතිමය විධිවිධාන සතුටුදායකව ක්‍රියාත්මක කිරීම පිණිස සියළුම රජයේ කාර්යාලවල කාර්ය සංවිධානයක් ඇති කිරීමේ අවශ්‍යතාවය දැනට පැන නැගී ඇත.

**06.** සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම සහ පළාත් සභාවකම මෙම කාර්යය සඳහා සුදුසු නිලධාරියෙකු හඳුනාගත යුතු අතර, අදාළ ආයතන ප්‍රධානියාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම වැඩ සටහන නිරීක්ෂණය කිරීමට හැකි වන පරිදි, ඒ පිළිබඳ නිශ්චිත වගකීම ඔහු වෙත පැවරිය යුතුය. අදාළ කාර්යාලවල ප්‍රධානීන් සහ ඉහත කී ආකාරයට හඳුනා ගනු ලැබූ නිලධාරීහු පිළිවෙලින් භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරි සහ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි යන නමින් හැඳින්විය යුත්තාහ.

**07.** සියළුම රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට මෙම වැඩ පිළිවෙල ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**08.** භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරියකු යටතේ කටයුතු කරන භාෂා ප්‍රතිපත්තිමය ක්‍රියාත්මක කිරීමේ නිලධාරින්,

(අ) භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධ නීතිය සහ රෙගුලාසි පිළිබඳව මනා දැනුමක් යුක්ත වන බව,

(ආ) භාෂා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන විධිවිධානවලට අනුකූලව තමාගේ ආයතන තුළ කටයුතු කිරීමට උපාය මාර්ගමය සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ කටයුතු සම්පාදනය කර ඇති බව,

(ඇ) එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රමාණවත් තරමින් නිරීක්ෂණය කිරීම පිණිස විධිවිධාන සැලැස්වෙන ක්‍රමයක් සකස් කර ඇති බව,

(ඈ) එම සැලසුම් ක්‍රියාත්මක කිරීම බාධා කෙරෙන දුෂ්කරතා මැඩලීමට අවශ්‍යවන කටයුතු කර ඇති බව සහ

(ඉ) අවශ්‍ය වන ඒ ඒ අවස්ථාවලදී අදාළ පරිදි රාජ්‍ය භාෂා කොමසාරිස්වරයාට හෝ රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහාය ලබා දී ඇති බව.

සහතික කෙරෙන බවට එකී භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරියා වග බලා ගන්නේ නම් ඔහු තම වගකීම් ඉටු කළා වූ හැටියට සලකනු ලබනවා ඇත.

**09.** ආණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය තම කාර්යාලයේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා, භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරියාට වගකිව යුතු වන්නේය. විශේෂයෙන්ම,

(අ) භාෂා සම්බන්ධ නීතිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තම යටත් නිලධාරීන්ට තිබෙන බවට,

(ආ) භාෂා පිළිබඳ නීතිය පිළිපදින බව සහතික කෙරෙනු පිණිස උපාය මාර්ග සැලසුම් සකස් කොට එම සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලබන බවට,

(ඇ) ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීමේ සහ අගය කිරීමේ නිසි ක්‍රමයක් සකස් කොට පවත්වාගෙන යන බවට,

(ඉ) අවශ්‍ය අවස්ථාවලදී වාර්තා, දත්ත සහ තොරතුරු අදාළ පරිදි රාජ්‍ය භාෂා කොමසාරිස්වරයාට හෝ රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලබා දෙන බවට.

වගබලා ගැනීම සහ ඒ සඳහා ප්‍රමාණවත් පියවර ගැනීම ඔහුගේ කාර්යය වන්නේය.

10. එසේ හෙයින්,

(අ) සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන්, පිළිවෙලින් තම තමන්ගේ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල, පළාත් සභාවල, රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකිව යුතු, භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරීන් හැටියට නම් කිරීමත්,

(ආ) සියළුම අමාත්‍යාංශවල (පරිපාලන) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්, සියළුම දෙපාර්තමේන්තුවල, පළාත් පාලන ආයතනවල, පළාත් සභාවල, රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල (පරිපාලන) නියෝජ්‍ය ප්‍රධානීන්, ඔවුන්ගේ මධ්‍යම සහ ප්‍රාදේශීය කාර්යලවල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් හැටියට නම කිරීමත් රජය විසින් තීරණය කර ඇත.

11. ඉහත තීරණ අනුව සුදුසු පියවර ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියා කල යුතුය.

අ.කලෙ/(ඩික්සන් නිලවීර)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය